| 04 | ඖෂධ සංයෝජක | 01 | රා.පරි.චක්‍රලේඛ 3/2016 අනුව PL2 රු. 25,250-10 x 270-10 x 300-10 x 330-12 x 350- රු. 38,450 | *විවෘත බඳවා ගැනීම :*<br>අ.පො.ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් 5ක් එකවර සමත් විය යුතුය.)<br>*සීමිත බඳවා ගැනීම :*<br>අ.පො.ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙ-යින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම (මින් විෂයයන් 5ක් එකවර සමත් විය යුතුය.) | *විවෘත බඳවා ගැනීම :*<br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදළ සේවා පළපුරුද්ද ලබා තිබීම.<br>*සීමිත බඳවා ගැනීම:*<br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබා තිබීම අදාළ පළාත් පාලන ආයතන-යේ වසර 05 ස්ථිර සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතුය. මෙම කාලය තුල කිසිදු විනය දඬු-වමක් ලබා නොතිබිය යුතුය. | |
| 05 | සෞඛ්‍ය කම්කරු | 01 | රා.පරි.චක්‍රලේඛ 3/2016 අනුව PL1 රු. 24,250-10 x 250-10 x 270-10 x 300-12 x 330- රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබිය යුතුය. | තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාව-යෙන් යුක්ත විය යුතුය. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෙනත් සුදුසුකම්* | *බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|---|---|
| 06 | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු | 03 | රා.පරි.චක්‍රලේඛ 3/2016 අනුව PL1 රු. 24,250-10 x 250 -10 x 270-10 x 300-12 x 330 - රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබිය යුතුය. | තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාව-යෙන් යුක්ත විය යුතුය. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනයකෙරේ. |
| 07 | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | 01 | රා. පරි.චක්‍රලේඛ 3/2016 අනුව PL -3 රු. 25,790-10 x 270-10 x 300-10 x 330-12 x 350- රු. 38,990 | *විවෘත බඳවා ගැනීම* :<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙ-යින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් 5ක් එකවර සමත් විය යුතුය.)<br><br>*සීමිත බඳවා ගැනීම* :<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙ-යින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම (මින් විෂයයන් 5ක් එකවර සමත් විය යුතුය.) | *විවෘත බඳවා ගැනීම* :<br>බරවාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ පැදවීම සඳහා මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතා "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.<br>බර යන්ත්‍ර ක්‍රියාක-රවීම පිළිබඳ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටමට අදාළ සහතික පතක් තිබිය යුතුය.<br><br>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතුය.<br><br>බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ එක් වසරක පළපුරුද්දක් තිබීම. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් | බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|---|---|
| | | | | | *සීමිත බඳවා ගැනීම* :<br><br>බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 වැඩිබර මෝටර් වාහන සහ බර ටේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතා "ඒ" පන්ති යේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.<br><br>බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ තෘතික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරනලද NVQ 04 මට්ටමට අදාල සහතික පතක් තිබිය යුතුය.<br><br>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතුය.<br><br>පළාත් පාලන ආයතනයක PL1/PL2 තනතුරක ස්ථිර කර තිබීම.<br>බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරක සේවා කාලය වසර 03 සම්පූර්ණ කර තිබීම.<br>බර වාහන ක්‍රියාකරවීම පිළිබඳ මාස 06ක පළපුරුද්දක් තිබිය යුතුය. | |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් | බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|---|---|
| 08 | විදුලි කම්බිකරු | 01 | රා.පරි.චක්‍රලේඛ 3/2016 අනුව PL2 රු. 25,250-10 x 270-10 x 300-10 x 330-12 x 350- රු. 38,450 | *විවෘත බඳවා ගැනීම :*<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙ- යින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයන් 5ක් එකවර සමත් විය යුතුය.)<br><br>*සීමිත බඳවා ගැනීම :*<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙ- යින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම (මින් විෂයන් 5ක් එකවර සමත් විය යුතුය.) | *විවෘත බඳවා ගැනීම :*<br><br>විදුලි කාර්මික තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම (සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>*සීමිත බඳවා ගැනීම :*<br><br>විදුලි කාර්මික තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යා- පන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබාගෙන තිබීම හා අවම වශයෙන් අදළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම (සහතික මගින් සනාථ කළය- තුය.)<br><br>අදාළ පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 සපුරා ඇති හා අදල කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05ක සතුටුදයක සේවා කාලයක් සපුරා ඇති සේවකයෙකු | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |

03. *බඳවා ගැනීම සඳහා වන පොදු කොන්දේසි :*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

iii. සෑම අයදුම්කරුවෙක්ම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක තුළ බස්නාහිර පළාතෙහි ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

iv. අයදුම්කරුවන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබුවෙක් නොවියයුතුය.

v. රාජ්‍ය සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.

vi. පෙර පාසැල් ගුරු තනතුර හා වෙළඳසැල් පරිපාලක තනතුර සඳහා අයදුම්කරනු ලබන විවෘත අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතුය. මෙම වයස් සීමාවන් පිළිබඳ කොන්දේසි දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

vii. ඉහත තනතුරු දෙක සඳහා අදළ නොවන අන් සියලු අයදුම්කරුවෙක්ම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. මෙම වයස් සීමාවන් පිළිබඳ කොන්දේසි දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

viii. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා අවම උස අඩි 05ක් විය යුතුය.

ix. හොරණ ප්‍රාදේශීය සභාවේ දැනටමත් අනියම් ආදේශක හෝ ව්‍යාපෘති මට්ටමේ සේවයේ යෙදෙන සතුටුදයක සේවා තත්වයකින් යුතු අය කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

x. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන අතර, අදළ විය හැකි සාධාරණ හේතු මත මෙම නිවේදනය සංශෝධනය කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අරමුදල යටතේ වන දයක මුදල් ගෙවිය යුතුය.

ii. පත්වීමේ දින සිට අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂක කාලයකට සීමාවකට යටත් වේ.

iii. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව, ශ්‍රී ලංකා ජනරජයේ නියෝග වලටද, ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද හා මුදල් රෙගුලාසිවලටද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය කොමිෂන් සභාවේ හෝ හොරණ ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරන නියෝග රෙගුලාසි හා නියෝග වලට අනුකූලව කටයුතු කිරීමට ද බැඳී සිටිය යුතුය.

iv. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකග විය යුතුය.

05. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි (12" x 8" ප්‍රමාණයේ) අයදුම්පතක් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2018.12.27 දිනට පෙර "ලේකම්, හොරණ ප්‍රාදේශීය සභාව, හොරණ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දින පසු වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික

iii. පදිංචිය සනාථ කිරීම සඳහා මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන කර තිබිය යුතුය.)
iv. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්
v. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික
vi. දැනට සේවය කරන්නේ නම් සේවා සහතිකය
vii. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

සැ.යු. - මෙම නිවේදනය සංශෝධනය කිරීම සඳහා කල් දැමීම හෝ අවලංගු කිරීම යන සියලු බලතල හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

ලේකම්,
හොරණ ප්‍රාදේශීය සභාව.

11-1438

---

# පළාත් පාලන නිවේදන

## කැස්බෑව නගර සභාව

### 2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160(1) වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව කැස්බෑව නගර සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම 2018 නොවැම්බර් මස 08 වැනි දින මහ සභාවේ යෝජනා අංක 5.3 යෝජනාව යටතේ සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

ලක්ෂ්මන් පෙරේරා,
සභාපති,
කැස්බෑව නගර සභාව.

2018 නොවැම්බර් මස 12 වැනි දින.

**යෝජනාව**

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වන වගන්තියෙහි (1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර කැස්බෑව නගර සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා කරමි.

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වන වගන්තියෙහි (1) උප වගන්තියෙන් කැස්බෑව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැස්බෑව නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල හා වාණිජ පරිශ්‍රයන්හි 2018 වර්ෂයට පිළිගෙන ඇති තක්සේරුව/සතොක්ෂණය 2019 වර්ෂයේ තක්සේරුව/සතොක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත්,

එකී තක්සේරුව මත, නගර සභා ආඥාපනතේ 160 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වාර්ෂික වරිපනම් බද්දක් නිවාස, ගොඩනැගිලි, ඉඩම් හා ගෙපත් සඳහා ද, සියයට දහයක (10%) වාර්ෂික වරිපනම් බද්දක් වෙළෙඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන සඳහාද නියම විය යුතු බවටත්,

තවද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කැස්බෑව නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල කැස්බෑව නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද කැස්බෑව නගර සභාව විසින් ලබාදිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

| *1 වන තීරුව* | *2 වන තීරුව* | *3 වන තීරුව* |
|---|---|---|
| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
| පළමු වන කාර්තුව | මාර්තු 31 දිනට පෙර | ජනවාරි 31 |
| දෙවන කාර්තුව | ජූනි 30 දිනට පෙර | අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | සැප්තැම්බර් 30 දිනට පෙර | ජූලි 31 |
| හතරවන කාර්තුව | දෙසැම්බර් 31 දිනට පෙර | ඔක්තෝබර් 31 |

11-1306

## ගම්පහ මහා නගර සභාව

### වරිපනම් බදු පැනවීම - 2019

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරිය යටතේ මහා නගර සභා ආඥාපනත මගින් පැවරීඇති බලතල අනුව මහා නගර සභා ආඥාපනතේ xii වැනි කොටසේ 230 (i) වැනි වගන්තිය යටතේ මහා නගර සභා සීමාව තුළ 2019 වර්ෂයට බලපැවැත්වෙන පරිදි වෙළෙඳ හා වාණිජ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන සඳහා තක්සේරු වටිනාකමින් 10% ක වාර්ෂික වරිපනම් බද්දක් ද, ගෘහ දේපළ සඳහා 7% ක වාර්ෂික වරිපනම් බද්දක් ද, මුඩු බිම් හා හිස් ඉඩම් සඳහා 15% ක වරිපනම් බද්දක් ද, 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2018 සැප්තැම්බර් මස 10 වැනි දින තීරණ අංක 114 යටතේ සම්මත කර ඇති බවත් ඒ අනුව පහත සඳහන් ආකාරයට බදු අය කිරීමට තීරණය කොට ඇති බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. පිළිවෙලින් 2019 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික 04 කින් ගෙවා නිම කළ හැකිය.
02. 2019 වර්ෂයට නියමිත බදු මුදල එම වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර සම්පූර්ණයෙන් ම ගෙවා නිම කරන්නේ නම් බදු මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ බදු මුදල් ඒ ඒ කාර්තුවේ මුල් මාසය තුළ ගෙවනු ලබන්නේ නම් සියයට පහක (5%) වට්ටමක් ද ලැබීමට ද හිමිකම් ලැබේ.
03. ඉහත 1 ඡේදයේ සඳහන් දිනවලට පසුව කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඉඩම් හා වාසස්ථාන දේපළ වෙනුවෙන් සියයට පහළොවක (15%) ගාස්තුවක් ද අනෙකුත් දේපළ වෙනුවෙන් සියයට විස්සක (20%) අමතර ගාස්තුවක් ද වරෙන්තු ගාස්තු වශයෙන් අය කරනු ලැබේ.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව ගම්පහ.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

11-1154

---

## මහනුවර මහා නගර සභාව

### වාර්ෂික වරිපනම් බදු පැනවීම

252 අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තිය ප්‍රකාර මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියළුම දේපළ සඳහා වාර්ෂික වටිනාකම මත පහත සඳහන් ප්‍රතිශතයට අනුව වරිපනම් බදු 2019 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. ගෘහස්ත දේපළ සඳහා වාර්ෂික වටිනාකමින් 11%
2. ගෘහස්ත නොවන දේපළ සඳහා වාර්ෂික වටිනාකමින් 17%
   (වාණිජ දේපළ, ඉඩම්, පුරන්වූ කුඹුරු, තනාගෙන යන ගොඩනැගිලි)
3. අස්වද්දන ලද කුඹුරු වරිපනම් බදුවලින් නිදහස් කර ඇත.

2019 වර්ෂයට නියමිත මුළු වරිපනම් බදු මුදල 2019.01.31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවන්නේ නම් 10% ක වට්ටමක් ද කාර්තුවට අදාළ බදු මුදල් එකී කාර්තුවේ මුල් මාසය තුළ ගෙවන්නේ නම් 5% ක වට්ටමක් ද දෙනු ලැබේ.

තවද 2019 වර්ෂයේ වරිපනම් බදු මුදල කාර්තු 04 (හතර) සඳහා සමාන වාරික හතරකින් (04) පිළිවෙලින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්හිදී හෝ ඊට පෙර ගෙවිය යුතු අතර එසේ නියමිත දිනට වරිපනම් බදු මුදල් නොගෙවන සියළුම දේපළ සඳහා මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය ප්‍රකාර ගෘහස්ත දේපළක් සඳහා 15% ක වරෙන්තු ගාස්තුවක්ද ගෘහස්ත නොවන දේපළක් සඳහා 20% ක වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේසර, ඩී. සේනානායක,
නගරාධිපති,
මහනුවර මහා නගර සභාව.

2018 නොවැම්බර් මස 02 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

11-1228/1

## මහනුවර මහා නගර සභාව

2019 වර්ෂයේ තක්සේරු ලේඛන

2019 වර්ෂය සඳහා වූ තක්සේරු ලේඛන අනුව සූදානම්ව ඇති බවත් එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත් 252 වැනි අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 235(1) වැනි වගන්තිය ප්‍රකාර මහජනයා වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

කේසර, ඩී. සේනානායක,
නගරාධිපති,
මහනුවර මහා නගර සභාව.

2018 නොවැම්බර් මස 02 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

11-1228/2

---

## රත්නපුර මහා නගර සභාව

අයවැය කෙටුම්පත - 2019

මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරය යටතේ 212 (ආ) වගන්තිය ප්‍රකාරව රත්නපුර මහා නගර සභාවේ 2019 මුදල් වර්ෂය සඳහා වන අය වැය කෙටුම්පත 2018 නොවැම්බර් මස 26 වන දින අවසන් වශයෙන් සළකා බැලීමට ඉදිරිපත් කරන අතර, මහජන පරීක්ෂාව සඳහා විවෘතව තබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2018 නොවැම්බර් මස 28 වැනි දින,
රත්නපුර මහා නගරසභා කාර්යාලයේ දී ය.

11-1367

---

## ගලිගමුව ප්‍රාදේශීය සභාව

පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධි විධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබ 2013.06.28 දිනැති අංක 1817 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පල කරන ලද සබරගමුව පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2018.07.20 දිනැති අංක 2081 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පල කරන ලද්ද වූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පල කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ගලිගමුව ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 13 වන දින පවත්වනලද මහා සභා රැස්වීමේ අංක 5.21 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1395

**මහ නගර සභාව - මීගමුව**

වරිපනම් බදු අය කිරීම - 2019

**මහ නගර සභා ආඥාපනතේ 235(1) වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නිවේදනයයි**

01. මහ නගර සභා ආඥාපනතේ 235(1) ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව මෙම මහ නගර සභාව 2019 වර්ෂයට අදාළ වරිපනම් බදු ලේඛන සූදානම් කර අදාළ නාගරික කාර්යාලයන්හි තබා ඇති බවත් එම ලේඛන බදු ගෙවන ජනතාවට පරීක්ෂා කර බැලිය හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. තවද මෙම මහ නගර සභා ආඥාපනතේ 230 වන ඡේදය අනුව එහි අඩංගු විධිවිධායන්ට යටත්ව මීගමුව මහ නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි වරිපනම් බදු පනවා අය කිරීමට තීරණය කර ඇති බවත් තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

03. මීගමුව බල ප්‍රදේශය තුළ පිහිටි සියළුම ව්‍යාපාරික හා වාණිජමය ස්ථානවල වාර්ෂික වටිනාකමින් සියයට දහතුන (13%) ක් ද, අනෙකුත් සියළුම නිවාස හා සෑම අන්දමින්ම විස්තර කෙරෙන ගොඩනැගිලි, ඉඩම් හා කුඩා නිවාස පන්තීන්හි වාර්ෂික වටිනාකමින් සියයට පහ (5%) ක බදු ප්‍රතිශතයක් ද,

04. කොච්චිකඩේ බල ප්‍රදේශය තුළ පිහිටි සියළුම ව්‍යාපාරික හා වාණිජමය ස්ථානවල වාර්ෂික වටිනාකමින් සියයට දොළහක් (12%) ද අනෙකුත් සියළුම නිවාස හා සෑම අන්දමින්ම විස්තර කෙරෙන ගොඩනැගිලි, ඉඩම් හා කුඩා නිවාස පන්තීන්හි වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) ක බදු ප්‍රතිශතයක් ද,

05. තලාහේන බල ප්‍රදේශය තුළ පිහිටි සියළුම ව්‍යාපාරික හා වාණිජමය ස්ථානවල වාර්ෂික වටිනාකමින් සියයට දෙළහක් (12%) ක් ද අනෙකුත් සියළුම නිවාස හා සෑම අන්දමින්ම විස්තර කෙරෙන ගොඩනැගිලි, ඉඩම් හා කුඩා නිවාස පන්තීන්හි වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) ක බදු ප්‍රතිශතයක් ද,

06. තවද 2019 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි හා සිව්වැනි කාර්තුවල වරිපනම් බදු මුදලින් පිළිවෙලින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි දී හෝ ඊට පෙරාතුව නාගරික කාර්යාලයන්ට ගෙවා අවසන් කළ යුතු බවත් එසේ නොගෙවනු ලබන සෑම වරිපනම් බද්දක් වෙනුවෙන්ම මහ නගර සභා ආඥාපනතේ 255 (අ) II, III ඡේද ප්‍රකාර දේපළෙහි ස්වභාවය අනුව සියයට පහලොව (15%) ක් හා සියයට විස්ස (20%) ක් ආදී වශයෙන් වූ අධි ගාස්තුවක් ද අය කරනු ලබන බවත් මෙයින් කාරුණිකව නිවේදනය කරමි.

07. මහ නගර සභා ආඥාපනතේ 230 (1) හා (4) වගන්තිය යටතේ ඇමතිවරයා විසින් සම්පාදිත රෙගුලාසි අනුව වාර්ෂික වරිපනම් බදු මුදල 2019 ජනවාරි 31 දින හෝ ඊට පෙර ගෙවනු ලබන්නේ නම් සියයට දහයක (10%) ක වට්ටමක්ද, ත්‍රෛමාසිකව පළමු මස තුළදී ගෙවනු ලබන්නේ නම් සියයට පහක (5%) ක වට්ටමක් ද බදු ගෙවන ජනතාවට ලබා දෙන බව වැඩිදුරටත් මෙයින් නිවේදනය කරමි.

08. ඔබ විසින් ගෙවනු ලබන බදු මුදල, ඔබ යහපත සඳහාම යොදවන බැවින්, අය විය යුතු බදු මුදල නියමිත දිනට ගෙවා ඔබගේ දායකත්වය සභාවට ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

එන්. බී. ආර්. වී. ප්‍රනාන්දු,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව, මීගමුව.

11-1359

---

**මොරටුව මහ නගර සභාව**

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍රදීමේ පනත

මෙහි පහත උපලේඛනයේ දක්වෙන තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දක්වෙන සමාජ ශාලාව එකී ස්ථානයේ පැවැත්වීම සඳහා 2019 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 6 වන වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසල හෝ සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල හෝ යම් පදිංචි තැනැත්තෙකු එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේනම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පලවූ දින සිට සති 4 ක් ඇතුළත තම විරෝධතාවයට හේතු ලියවිල්ලකින් දක්වමින් පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපතිද, ලේකම් ද, කළමනාකරුද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|
| අනුර උපාලි සෙනෙවිරත්න අංක 108, ශ්‍රී මහා විහාර මාවත, පානදුර | සභාපති | කැටමරන්ස් ක්‍රීඩා සමාජය | 181/6, නවගාලු පාර, මොරටුව. |

කඳන ආරච්චිගේ තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

11-1322

---

**මාතර මහා නගර සභාව**

1957 අංක 17 දරන සමාජ ශාලා වලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දක්වෙන සමාජ ශාලාවලට එකී ස්ථානයේ පැවැත්වීම සඳහා 2019 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීමට මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලා අසල හෝ එකී සමාජශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එම ක්‍රීඩා සමාජශාලා සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේනම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති 04 ක් ඇතුලත තමාගේ විරුධත්වයට හේතු ලිඛිතව පිටපත් (02) දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2019 නොවැම්බර් මස 13 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අයදුම්කරුගේ නම* | *සමාජ ශාලාවේ සභාපතිද/ලේකම් ද, කළමනාකරුද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය* |
|---|---|---|---|
| 1. කේ. එස්. බැසිල් | ලේකම් | ඕජ්සීස් ක්‍රීඩා සමාජය | අංක 76, රාහුල පාර, මාතර |
| 2. තුසිත වික්‍රමසිංහ | ලේකම් | ප්‍රින්ස් ක්‍රීඩා සමාජය | අංක 103, අකුරැස්ස පාර, ඉසදීන් නගරය, මාතර |
| 3. නිෂානි ජයන්තා තිලකවර්ධන | ලේකම් | පැරකුම් ක්‍රීඩා සමාජය | අංක 71, බතුතා පාර, මාතර |
| 4. ලලිත් සිරිවර්ධන | ලේකම් | ජනතා ක්‍රීඩා සමාජය | අංක 50, කුමාරතුංග මාවත මාතර |

11-1428

**ගම්පහ මහා නගර සභාව**

2019 වර්ෂයට අදල බලපත්‍ර ගාස්තු පැනවීම

මහා නගර සභා ආඥා පනතෙහි (252 වන අධිකාරිය) 247 අ. වගන්තිය ප්‍රකාරව, මා වෙත පැවරී ඇති බලතල අනුව ගෝඝාතක ආඥා පනතෙහි අංක iv(1) වගන්තිය සම්බන්ධයෙන් 2018.09.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් පහත සඳහන් යෝජනාව සම්මත කරන ලදුව 2018.10.12 දින මහා සභාවේ දී සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
නාගරික කොමසාරිස්,
ගම්පහ මහා නගර සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

මහා නගර සභා ආඥා පනතේහි (252 වන අධිකාරිය) 247 අ. වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ගෝඝාතක ආඥා පනතෙහි අංක iv(1) වගන්තිය යටතේ ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක මස් විකිණීම සම්බන්ධව 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන බල පත්‍රයක් සඳහා රු. 25 ක ගාස්තුවක් පනවා අයකල යුතු යැයි තීරණය කරමි.

එසේම එම ගාස්තුව 2019 මාර්තු 31 දිනට හෝ ඊට ප්‍රථම ගෙවීමට කටුයතු කරන ලෙස ද දන්වා සිටිමි.

11-1273

---

**ගම්පහ මහා නගර සභාව**

2019 වර්ෂය සඳහා සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

ගම්පහ මහා නගර සභාව විසින් 2018.09.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් නිර්දේශ කර 2018.10.12 දින පැවති මහා සභා රැස්වීමේ දී තීරණ අංක 144 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලබයි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
නාගරික කොමාසාරිස්,
ගම්පහ මහා නගර සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
ගම්පහ මහා සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනතෙහි (477 අධිකාරය) 4 වන වගන්තිය ප්‍රකාරව සම්පහ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂය සඳහා සුනඛයින් ලියාපදිංචි කිරීම වෙනුවෙන් රු. 5 ක ගාස්තුවක් අය කරන බවත් යෝජනා කරන්නේ ය.

11-1274

**මහනුවර මහ නගර සභාව**

1975 අංක 17 දරන සමාජ ශාලා වලට බලපත්‍ර ලබා දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාවක් එකී ස්ථානයේ පැවැත්වීම සඳහා 2019 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාවක් අසල හෝ එකී සමාජශාලාවන් සඳහා අපේක්ෂිත ස්ථානයක් අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේනම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති 04 ක් ඇතුලත තමාගේ විරෝධත්වයට හේතු ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *සමාජ ශාලාවේ සභාපතිද, ලේකම් ද, යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|
| ලේකම් | ලේකම් | ඕල්ඩ් ට්‍රිනිටියන්ස් ස්පෝට්ස් ක්ලබ් | අංක 28, අස්ගිරිය, මහනුවර |

කේසර ඩී. සේනානායක,
නාගරාධිපති,
මහ නගර සභාව මහනුවර.

2018 නොවැම්බර් මස 08 වැනි දින,
මහා නගර සභාව, මහනුවර.

11-1144

---

**ගලේවෙල ප්‍රාදේශීය සභාව**

වරිපනම් බද්ද - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (I) හා (II) වැනි වගන්ති ප්‍රකාර, ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල පිහිටි දේපලවල වාර්ෂික වටිනාකමින් පහත උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වරිපනම් බද්දක් 2019 වර්ෂයට පනවා අය කිරීමට තීරණය කරඇති බව මෙයින් දන්වා සිටිමි.

| ප්‍රදේශය | ගෘහස්ථ | වාණිජ | හිස් ඉඩම් |
|---|---|---|---|
| මාතලේ පාර | 6% | 7% | 5% |
| කුරුණෑගල පාර | 6% | 7% | 5% |
| දඹුල්ල පාර | 6% | 7% | 5% |
| කලාවැව පාර | 6% | 7% | 5% |
| ජයතිලක මාවත | 6% | 7% | 5% |
| ධර්මපාල මාවත | 6% | 7% | 5% |
| ආනන්ද රාජකරුණා මාවත | 6% | 7% | 5% |
| බණ්ඩාරනායක මාවත | 6% | 7% | 5% |

02. තව ද මෙකී පනතේ 134(7) වැනි වගන්තියේ ප්‍රකාර වාර්ෂික බදු මුදල් සම්පූර්ණයෙන් ගෙවන අවස්ථාවේදී පහත සඳහන් පරිදි වට්ටම් ප්‍රමාණයක් ප්‍රදානය කරන බව දැනුම් දෙමි. 2019 ජනවාරි 31 හෝ ඊට පෙර වර්ෂයට ගෙවිය යුතු මුළු වරිපනම් බද්ද ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10% ක වට්ටමක් ද, බදු මුදල එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලැබුවහොත් හෝ එසේ ගෙවන එම මුදලින් 05% ක වට්ටමක් ද දෙනු ලැබේ.

03. ඉහත කී පරිදි පනවන ලද වරිපනම් බද්ද නොගෙවන අයගෙන් අයවිය යුතු හිඟ මුදල් අනුව ව්‍යාපාරික දේපලක් වෙනුවෙන් 20% ක් හෝ අනිත් සෑම දේපලක් සඳහා 15%ක වූ වරෙන්තු ගාස්තුක් එකී ප්‍රදේශීය සභා පනතේ 161 වැනි වගන්තියේ (අ) යටතේ අය කරන බවද, හිඟ බදු මුදල් නොගෙවීමේ හේතුව මත දේපල තහනමට ගන්නා අවස්ථාවක එහි 161 (ආ) , (ඇ), (ඉ) සහ (ඊ) වගන්ති ප්‍රකාර අදළ ගාස්තු ගෙවිය යුතු බවටද මෙයින් නිවේදනය කරමි.

ඇම්. පී. ආර්. ජයතිලක,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව,<br>
ගලේවෙල.

2018 නොවැම්බර් මස 09 වැනි දින,<br>
ගලේවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1095

---

## ගාල්ල මහා නගර සභාව

### 2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ගාල්ල මහා නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 15 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 6(11) සහා සම්මුතිය අනුව පහත දක්වෙන යෝජනා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. 2019 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බදු මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභා කාර්යාලයට ගෙවියයුතු බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

02. 2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය(10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

03. ඉහත සඳහන් කාල සීමාව තුළදී වරිපනම් බදු නොගෙවන අදළ මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් සියයට පහළොවක (15%) වරෙන්තු ගාස්තුවක් ද මුඩු ඉඩම් හා වාසස්ථාන නොවන අනෙකුත් දේපළ වෙනුවෙන් සියයට විස්ස(20%) ක වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලැබේ.

ප්‍රියන්ත ජී. සහබන්දු,<br>
නගරාධිපති,<br>
මහා නගර සභාව, ගාල්ල.

2018 ඔක්තෝබර් මස 15 වැනි දින,<br>
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වැනි වගන්තිය (1) වැනි උපවගන්තියෙන් මහානගර සභාව වෙත කරන ලද නියමය ප්‍රකාර, ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශ ඇතුළත පිහිටි සියලුම නිවාස වල, ගොඩනැගිලිවල,ඉඩම් වල හා කවර වූ හෝ ගෙවල් වල වාර්ෂික තක්සේරු වටිනාකම වශයෙන් 2018 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම 2019 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම වශයෙන් පිළිගැනීමටත් ,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ගාල්ල මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමින්.

*(අ)* නේවාසික ස්ථාන මත සියයට හත (7%) ක වරිපනමක් ද, සහ<br>
*(ආ)* වෙළඳ හෝ වානිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට දෙළහ (12%) ක වරිපනමක් ද,<br>
*(ඇ)* අනෙකුත් සියලුම රජයේ දේපළ හිස් ඉඩම් සඳහා සියයට විසිදෙක (22%) ක වරිපනමක් ද, 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම් එකී මහා නගර සභා ආඥපනතේ 230 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දින වලින් අවසන්වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් ගාල්ල මහා නගර සභාව යොජනා කරන්නීය.

11-1139

---

## ජා ඇල නගර සභාව

### 2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1939 අංක 61 දරන නගර සභා ආඥපනතේ 160(1) වගන්ති විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව 2019 වර්ෂයට අදළව වරිපනම් බදු නියම කිරීම පිණිස ජා ඇල නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම වූ නිවාස වල, ගොඩනැගිලි වල ඉඩම් වල, ගෙපත් වල වාර්ෂික වටිනාකම මත 2016 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව 2019 වර්ෂය සඳහා පිළිගෙන පැනවීමට 2018 සැප්තැම්බර් 14 වැනි දින පැවති මහ සභාවේ අංක (05)-01-9, (05)-01-10 සහ (05)-01-11 යටතේ සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව 1939 අංක 61 දරන නගර සභා ආඥ පනතේ 166 වන වගන්තිය යටතේ ජා ඇල නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාස වල, ගොඩනැගිලි වල, ඉඩම් වල, ගෙපත් වල වාර්ෂික වටිනාකම සඳහා 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යෙක්ෂණය 2019 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යෙක්ෂණය ලෙස සම්මත කළ යුතු බවත්, එකී තක්සේරුව මත 1939 අංක 61 දරන නගර සභා ආඥපනතේ 160(1)(3) වගන්ති මගින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් නේවාසික දේපල සඳහා සියයට තුන (3%) ක් ද, වානිජ දේපල සඳහා සියයට දහය (10%) ක් ද, වාර්ෂික වරිපනම් බද්දක් ලෙස නියම විය යුතු බවත්,

තවද, 2019 වර්ෂය තුල පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් එහි ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස සම්පූර්ණ වාර්ෂික වරිපනම් බද්ද (හිඟ ශේෂයක් නොමැති විටදී) 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන් වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ වරිනම් බදු මුදල නගරසභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද නගර සභාව විසින් ලබා දිය යුතු බවටත් 2019 වර්ෂයට අදාළ වරිපනම් බදු පහත උපලේඛනයේ 11 වැනි තීරුවෙහි පරිදි නියමිත කාර්තුව අවසාන දින හෝ ඊට පෙර ගෙවා අවසන් නොකලහොත් එදිනට පසු එළඹෙන දින සිට නේවාසික දේපල සඳහා 15%ක අධිගාස්තුවක් ද, නේවාසික නොවන දේපළ සඳහා 20% ක අධිගාස්තුවක් ද වරිපනම් බද්දට එකතු කළයුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. ශම්මික ඩයස්,
සභාපති,
නගර සභාව - ජා ඇල.

2018 ඔක්තෝබර් මස 03 වන දින.
ජා ඇල නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *1 වන තීරුව* | *2 වන තීරුව* | *3 වන තීරුව* |
|---|---|---|
| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
| පළමුවන කාර්තුව | 2019.03.31 | 2019.01.31 |
| දෙවන කාර්තුව | 2019.06.30 | 2019.04.30 |
| තුන්වන කාර්තුව | 2019.09.30 | 2019.07.31 |
| හතරවන කාර්තුව | 2019.12.31 | 2019.10.31 |

11-1114

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,<br>
සභාපති,<br>
උඩුනුවර ප්‍රාදේශීය සභාව,<br>
ගෙලිඔය.

### ලියාපදිංචි කළ යුතු මාර්ග

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරී වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (අඩි)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අංක 87- හැපාන | තිකාංග උඩවෙලවත්ත මාර්ගය | ගරුමුණි ගෙදර ප්‍රේමතිලක මහතාගේ ඉඩම අසලින් | ගොඩේ විතානගේ මධුක අසේල අමරසිංහ හා ඩබ්ලිව්.ජේ. අත්තනායකගේ ඉඩම අසලින් | 1. ජී. ජී. ප්‍රේමතිලක මයා, උඩතිකාංගවත්ත හා පල්ලේගරුමුණි ගෙදර වත්ත<br>2. ආර්. එම්. ජී. වික්‍රමනායක මයා, අල්විස් අප්පුවත්ත<br>3. ඩබ්. එම්. අමරදාස මයා, ගරුමුණි ගෙදරවත්ත හා හපුගස්වෙලේ හේනවත්ත<br>4. ඒ. ජී. ජී එස්. අරියරත්න මිය, උඩතිකාංගවත්ත හා උඩවෙල වත්ත<br>5. ආර්. ජී. ඒ. එස්. රාජපක්ෂ මිය උඩවෙල වත්ත<br>6. ජී. වී. එම්. ඒ. අමරසිංහ මයා, උඩවෙලවත්ත | 1. ජී. ජී. ප්‍රේමතිලක මයා, උඩතිකාංගවත්ත හා පල්ලේගරු මුණිගෙදරවත්ත<br>2. ජී. ජී. වීරසිංහ මයා, ගෙදරවත්ත<br>3. ආර්. කේ. සෝමාවතී මිය, උඩතිකාංගවත්ත හා උඩවෙල වත්ත<br>4. ඩබ්. ජේ. අත්තනායක මයා | මීටර් 658 | අඩි 10 |


| අනු. අංකය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | අංක - 74 හියාරාපිටිය | ජයමාවත | දවුලගල පිළිමතලාව මාර්ගය | 23/2, හියාරාපිටිය, හන්දෙස්ස නිවස | 1. බී. ඩී. එච්. පී. බෝධිකොටුව, බෝධිකොටුවේ ගෙදරවත්ත<br>2. කේ. එන්. ඩී. යූ. ද සිල්වා මයා බෝධිකොටුවේ ගෙදරවත්ත | 1. එන්. ඩබ්. ඩී. එම්. ජයසිංහ මයා දුක්ගන්නාරාලගේ හිටිනාගෙදර වත්ත *හෙවත්* බෝධිකොටුවේ ගෙදරවත්ත<br>2. එන්. ඩබ්. ඩී. එන්. ජයසිංහ මිය, දුක්ගන්නාරාලගේ හිටිනාගෙ දරවත්ත *හෙවත්* බෝධිකොටුවේ ගෙදරවත්ත<br>3. කේ. එල්. ටී. එන්. ජයතිස්ස මිය, දුක්ග න්නාරාලගේ හිටිනාගෙ දරවත්ත *හෙවත්* බෝධිකොටුවේ ගෙදරවත්ත<br>4. කේ. එල්. එන්. ජයතිස්ස මයා දුක්ග න්නාරාලගේ හිටිනාගෙ දරවත්ත *හෙවත්* බෝධිකොටුවේ ගෙදරවත්ත | අඩි 120 | අඩි 10 |
| 3 | අංක 53 - එළදූත්ත බටහිර | සාරා ලේන් | දවුලගල ගෙලිඔය මහා මාර්ගයේ එළදූත්ත හන්දිය ළඟ සිට | එම්. එච්. එම්. නවාස් මයාගේ ඉඩම | 1. සිතී සුලීහා මිය | 1. ඒ. එල්. සාරා උම්මා මිය | අඩි 150 | අඩි 06 |

K.B.LANSAKARANAYAKE
Regd.Licensed Surveyor
215,Pilimathalawa.

PLAN NO : 9222

LENGTH = 117M
(A,B,C)

NIKAANGA - UDAWELA ROAD




Reference
St:Stake wooden

PLAN
of
An Allotment of Land Called
NIKAANGA - UDAWELA WATTA ROAD
Situated at = Haladiwela
G.S. = Hepana
In Medapalatha Korale of Udunuwara
A.G.A. = Udunuwara
Pradeshiya Saba = Udunuwara
Kandy District
Central Province

| CONTAINING IN EXTENT | | |
|---|---|---|
| Lot No | A - R - P | (Hect:) |
| 1 | 0 - 0 - 13.57 | (0.0343) |

Surveyed on = 01.11.2018


(Signature)

K. B. LANSAKARANAYAKE (F. S. I.)
Registered Licensed Surveyor
(J: P. All Island)
215, Pilimatalawa

**R.L.K.JAYASUNDERA,**
*Registered Licensed Surveyor & Leveller,*
*Pamunuwa Group , Pilimatalawa.*

**PLAN No : J 3789**

*Reference:*
*B-Bank.*
*U-Undefined.*
*CP-Concrete Post.*
*EP-Electric Post.*
*RW-Retaining Wall.*
*LF-Live Fence.*
*WF-Wire Fence.*
*RDA-Road Development Authority.*
*Gi.-Ginisiriya tree.*
*Ka-Kada tree.*
*St-Stake.*




*Scale - 1 : 500*

## PLAN

*Of*

*Portion of* ***Dukgannaralalage Hitinagederawatta*** *alias* ***Bodikotuwegederawatta*** *-Now Reserved for Road-*
*(Being Re survey of Lot 120 in Cadastral Map No: 320305 , Block No: 1 out of 2 Blocks in Sheet No: 1 and signed by Superintendent of Surveys ,Kandy District on behalf of the Surveyor General and also land shown as Lot 4 in Plan No: 1912 dated 20-12-1997 made by Mr. P.M.G.Munasinghe Licensed Surveyor & Leveier )*
*Situated at Hiyarapitiya Village in*
*Hiyarapitiya Grama Niladhari Division of Udunuwara Divisional Secretariat Division*
*Within the Pradeshiya Sabaha Limits of Udunuwara*
***KANDY DISTRICT : CENTRAL PROVINCE***

| Lot No: | Extent | | Boundaries | | | |
|---|---|---|---|---|---|---|
| | Hectares | (A. - R. - P. ) | North by | East by | South by | West by |
| 1 | 0.0133 | (0 - 0 - 05.3) | From Pilimatalawa to Daulagala Main Road (RDA) | Bodikotuwewatta,claimed by B.D.R.Harindra Prasad Bodikotuwa and Bodikotuwewatta, claimed by K.N.D.U.de Silva | Dukgannaralalage Hitinagederawatta alias Bodikotuwegederawatta,claimed by K.L.N.Jayatissa | Dukgannaralalage Hitinagederawatta alias Bodikotuwegederawatta claimed by K.L.T.N.Jayatissa and Dukgannaralalage Hitinagederawatta alias Bodikotuwegederawatta claimed by N.W.D.Nawarattne Jayasinghe , Nshanthi Jayasinghe and others . |
| Total | 0.0133 | (0 - 0 - 05.3) | | | | |

*Surveyed on 04th November 2018 .*

*Note: 1. This survey done at th request of Mr.K.L.N.Jayatissa, Mrs.K.L.T.N. Jayatissa , Mrs.Nishath Jayasinghe Mr. Manjula Jayasinghe Mr.B.D.R. Harindra Prasad Bodikotuwa and Mr.K.D.U.N.de Silva.*


Jayasundera
07/11/2018

R. L. K. JAYASUNDERA
Registered Licensed Surveyor, Leveller *Registered Licensed Surveyor & Leveller.*
And Court Commissioner and Valuer
Pamunuwa Group, Pilimatalawa.
Tel : 081-2579205, 081 [illegible]31466

**M.R.M.SAFAN (BSc.Surveying Sc.)**
*REGISTERED LICENSED SURVEYOR*
*REGISTRATION NO.19951728*
*LAND SURVEY COUNCIL*
*No.120, ILLAWATURA,*
*GAMPOLA.*
*T.P.No. 0776065233*

**PLAN NO: 276**






Scale 1 : 500

# PLAN

Of

Divided portion of the land called EGODAWATTA alias POTUVILEWATTA
(being Part of Lot 2 in Plan No.4207 of 06.01.2015 by P.M.G.Munasinghe Licensed Surveyor)
Situated at
Eledetta-Arattana within the Pradeshiya Sabha Limits of Udunuwara
in the Grama Niladari division of Eledetta(Wasama No.53)
in Medapalatha korale of Udunuwara D.S.Division

**KANDY DISTRICT**

**CENTRAL PROVINCE**

Bounded as described above

| Containing in Extent | | | | | |
|---|---|---|---|---|---|
| Lot No | Hectares | A. | R. | P. | |
| 1 | 0.00119 | 0 | 0 | 00.47 | Reserved for Access |

Note:–
Surveyed at the request of and boundaries pointed out by Sithi Zulaiha & M.H.M.Aqeel of 137D,Eladetta,Handessa & Sara Umma of 137G,Eladetta,Handessa

Surveyed on : 28th October 2018.

M.R.M. SAFAN BSc.(Surveying Sc.)
Registered Licensed Surveyor & Valuer
LSC.Reg.No.19951728
NO.120,Illawatura, Gampola
30.10.2018
**Registered Licensed Surveyor & Leveller**